පාඩම - උද්‍යාන අලංකරණ නිර්මාණ සාදමු.

1. උද්‍යාන අලංකරණ උපාංගයක් ලෙස මාළුවෙකු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලැයිස්තුවක් සකස් කරන්න.
2. පහත රූප සටහන් වලට අයත් නිවැරදි වාක්‍ය තෝරා නියමිත රූපයේ අංකය වරහන් තුල යොදන්න.



1 2 3 4

I. හලා ගන්නා ලද වැලි කොටස් දෙකකට සිමෙන්ති කොටස් එකක් දමා ජලය එකතු කර මිශ්‍ර සකස් කළ බදාම මේසන් හැදි භාවිතයෙන් කුකුල් දැල් ආකෘතිය පුරවා මාළුවාගේ ඇස් ,කට ආදී හැඩ තල ගොඩනගා ගැනීම.

(_____)

II. මාළුවේකුගේ හැඩය ලැබෙන සේ කුකුළු දැල සකස් කර නියමිත හැඩය ලබා ගැනීමට බයින්ඩින් කම්බි ඔතා එය ප්‍රධාන ආධාරක කම්බියට සම්බන්ධ කිරීම. (_____)

III. අගල් 12×12 ලී කැබැල්ල මැද මිලිමීටර් 10 ක් දිග කම්බිය Z අකුරේ හැඩයට නොසල්වෙන සේ සවිකර ගැනීම. (_____)

IV. මාළුවාගේ රූපය නිර්මාණය කිරීමෙන් පසු එය වියළීමට තබා වෙදර්ෂීල් හෝ ලැකර් භාවිත කර වර්ණ ගැන්වීම. රත්තරන් කුඩු හෝ තඹ කුඩු යොදා අලංකාර කර නිමා කිරීම. (_____)

3. ක්‍රියාකාරී මිනිස් ඉරියව්වක් පිලිඹිඹු වන සේ උද්‍යාන නිර්මාණයක් සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලියන්න.
4. එම මිනිස් රූපය නිර්මාණය කරන ආකාරය රූප සටහන් සහිතව පියවර වශයෙන් ලියන්න.